# වයඹ පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම

**කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) සේවා ගණයට අයත් කළමනාකරණ සහකාර තනතුර (ස්ථිර ) - පුරප්පාඩු සංඛ්‍යාව 09**

**අධ්‍යාපන සුදුසුකම්**

- අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සිංහල/දෙමළ, ගණිතය, ඉංග්‍රීසි යන විෂයන් ඇතුළුව විෂයයන් හතර (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයන් හය (06) කින් සමත්ව තිබීම හා අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

**තනතුරට විශේෂිත වෙනත් අවශ්‍ය සුදුසුකම්**

- රජයේ පිළිගත් ආයතනයක වසරකට නොඅඩු පරිගණක පාඨමාලාව හදාරා සමත් වී තිබීම.
- වයඹ පළාත තුළ ස්ථිර පදිංචිකරුවකු වීම
- වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය.

**තනතුරට අදාළ වැටුප් පරිමාණය**

- 27,910-300X10-350X7-495X4-660X20-48,540

**ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයට අයත්**

**කාර්යාල කාර්ය සහායක තනතුර (ස්ථිර) - පුරප්පාඩු සංඛ්‍යාව - 04**

**අධ්‍යාපන සුදුසුකම්**

- අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී යටත් පිරිසෙයින් විෂයන් දෙකක් සමත් වී තිබීම

**වෙනත් සුදුසුකම්**

- වයඹ පළාත තුළ ස්ථිර පදිංචිකරුවකු වීම
- වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය.

**තනතුරට අදාළ වැටුප් පරිමාණය**

- වැටුප් පරිමාණය 24,750 – 10X250 – 10X270 – 7X300 – 15X330 – 37,000

**කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) සේවා ගණයට අයත් ජංගම පරීක්ෂක (කොන්ත්‍රාත් පදනම මත) - පුරප්පාඩු සංඛ්‍යාව - 05**

**අධ්‍යාපන සුදුසුකම්**

- අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සිංහල/දෙමළ, ගණිතය, ඉංග්‍රීසි යන විෂයන් ඇතුළුව විෂයයන් හතර (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයන් හය (06) කින් සමත්ව තිබීම හා අධ්‍යාපන පොදු සහතික පත්‍ර ( උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

**වෙනත් සුදුසුකම්**

- උස අඩි 5ක් හා අඟල් 6ට වඩා වැඩි විය යුතුය.
- පපුව අඟල් 32 ට වඩා වැඩි විය යුතුය.
- දෘෂ්ටිය 6 – 6
- වයඹ පළාත තුළ ස්ථිර පදිංචිකරුවකු වීම
- වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය.

**තනතුරට අදාළ වැටුප් පරිමාණය**

- 27,910-300X10-350X7-495X4-660X20-48,540

**සැ. යු :-** ඔබ විසින් සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයක් **2025.01.27** දිනට ප්‍රථම සාමාන්‍යාධිකාරී, මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය, හාල්පාර හංදිය, මීගමු පාර, බෝයගනේ යන ලිපිනයට ලියාපදිංචි තැපැල මගින් එවිය යුතුය. ලියුම් කවරයේ වම්පස කෙලවරේ අයදුම් කරන තනතුරු නාමය සඳහන් කළ යුතුය